# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/17 - 2023 ජූලි මස 18 වැනි අඟහරුවාදා - 2023.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, 2021.03.22 දිනැති අංක 2220/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ අංක 04 - 175 යටතේ පළ කරන ලද නිවේදනයේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 0.6ක් යනුවෙන් සඳහන් වූවත්, එහි ප්‍රමාණය ''පර්චස් 3.8'' ලෙස සංශෝධනය විය යුතු අතර ඉඩමේ මායිම් සහ ඉඩමේ නම පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**ඉඩමේ නම : රත්වත්ත වත්ත**

*උතුරට* : වයි. ජී. විමලරත්න බණ්ඩා හිමිකම් කියන රත්වත්ත වත්ත,
*නැගෙනහිරට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල පවිත්‍රාගාරය පිහිටි රත්වත්ත වත්ත,
*දකුණට* : ඩබ්ලිව්. ජී. පත්මසිරි හිමිකම් කියන රත්වත්ත වත්ත,
*බටහිරට* : ඩබ්ලිව්. ජී. සෝමසිරි හිමිකම් කියන රත්වත්ත වත්ත.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/MT/382

2023 ජූලි මස 06 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 07-0163


1A - G 39919— 14 (2023/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2150/24 හා 2019.11.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 1A පිටුවේ ප්‍රකාශයට පත්කරන ලද නියමයේ උපලේඛනයේ ඉඩමේ නම ඇටම්පිටිය වත්ත යනුවෙන් සඳහන් කර ඇතත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද අංක B/HLE/2020/555 දරන ප්‍රගමන අනුරේඛනයෙහි සඳහන් පරිදි ඉඩමේ නම ගොල්ලෙකන්දපතන යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/BD/492

2023 ජූලි මස 13 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 07-0164

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.